1981 අංක 17 දරණ පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස් පනතේ 18 වන වගන්තිය යටතේ පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස්ගේ වාර්තාව -2017

හැඳින්වීම

"නිලධාරිවාදයෙන් රට පාලනය කළ කාලය ඉකුත් වී බොහෝ කල් ගොසිනි. දැන් උදා වී ඇත්තේ පාර්ලිමේන්තු ක්‍රියාදාමයන් ඔස්සේ, අඩු හෝ වැඩි වශයෙන් ප්‍රජාතන්ත්‍රවාදයට අනුගත වෙමින්, ජනතාවට වගකියනු ලබන ජනතා රජයකි. ඔබ ජනතා හිතවාදී ජනතා සේවකයින් බව ඔවුන්ගේ සිත්තුළට කාවද්දමින්, ගෞරත්වයේ, අවංකත්වයේ, සාධාරණත්වයෙහි සහ සමානව සැලකීමෙහි ලා ඉහලතම ප්‍රමිතීන් පවත්වා ගෙන බවට සෑහීමට පත්වන්න." (1948 මාර්තු මස 25 වන දින, ක්වීඩ් -ඊ- අසාම් මහතා විසින් ජොෂ්ඨ නිලධාරීන් අමතා චිතගොං හිදී කරන ලද දේශනය)

විද්‍යාර්ථීන් හා ආයතන බොහොමයක් එදා මෙන්ම අදත් හඳුන්වන ආකාරයට ඔම්බුඩ්ස්මන් ඉතිහාසය දහනව වන සියවස දක්වා දිවෙයි. 1809 දී ස්වීඩන පාර්ලිමේන්තුව විසින් "රජු, ඔහුගේ කාර්ය කාර්ය මණ්ඩලය සහ ස්වීඩනයේ ජාතික ව්‍යවස්ථාදායකය සහ තීරණ ගැනීම සඳහා වන උත්තරීතර ආයතනය (Riksdag) සතු අධිකරණ අධීකෂණය කිරීම" සඳහා ඔම්බුඩ්ස්මන්වරයකු පත්කිරීමට තීරණය කළේය. වර්තමාන ඔම්බුඩ්ස්මන්වරයාගේ කාර්යභාරය සහ වගකීම්, මෙම කාර්යයන් අභිබවා පුළුල් වී ඇත. කෙසේවෙතත්, ස්වීඩන ප්‍රභවය නියම වශයෙන් ඔම්බුඩ්ස්මන්වරයාගේ මූලාරම්භය පමණි. ඔම්බුඩ්ස්මන් ආයතනය ස්ථාපනය කිරීම පිටුපස ඇති ප්‍රධානම අදහස දෙස බලන කළ, මහජනතාවට සාධාරණය ඉටු කිරීම සඳහා, පුද්ගල පැමිණිලි විමර්ශනය සහ රාජ්‍ය පරිපාලනය අධීක්ෂණය කිරීමට බලයලත්, පහසුවෙන් ළඟා විය හැකි ආයතනයක් සැපයීමයි.

රාජ්‍ය සේවක පිරිස් වූ කලී හිතවාදී තම සේවකයින් බවට හැඟීම ජනතා සිත්සතන් තුළ පහල කරවීම රජය විසින් කළයුතු වේ. අවාසනාවකට මෙන් සමහර රජයේ සේවකයින් ජනතා හිතකාමීන් මෙන්ම ජනතා සේවකයින් බවට පත්වීමේ අභිලාෂය මඟහරවා ගනිමින්, එයට ප්‍රතිවිරුද්ධව ජනතා පාලකයින් බවට පත්වීමට වෙර දරති.

තමන් පාවාදී ඇති බව පොදු ජනතාවගේ විශ්වාසය වන අතර, තමනට විරුද්ධව කෙරෙන කිසියම් අසාධාරණයක් හමුවේ ඔවුහු අසරණ වෙති. නීතියේ සරණ පතා යාම අතිශයින් වෙහෙසකාරී සහ වියදම් සහිත ක්‍රියාමාර්ගයකි. සාවද්‍ය ක්‍රියාදාමයන්හි නියැලෙන නිලධාරීන්ට විරුද්ධව හුදෙක් ඔවුන්ගේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් වෙත පැමිණිලි ගොනු කර, සාධාරණය අපේක්ෂා කිරීම වඩාත් නිෂ්ඵල ව්‍යායාමයකි.

පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස් කාර්යාලය හෙවත් ඔම්බුඩ්ස්මන් කාර්යාලය ස්ථාපිත කිරීමෙන් පසු, ශ්‍රී ලංකාවේ අගතියට පත් පුරවැසියන්ට කඩිනමින් සහ පහසුවෙන් සාධාරණත්වය ලඟාකර දීමේ අපගේ පරම අභිලාෂය සාක්ෂාත් කරගැනීමෙහි ලා අප දුර ගමනක් පැමිණ ඇත. ආරම්භයේදී ඉතා සුළුවෙන් ආරම්භ කරන ලද මෙම සත්කාරයෙන් ප්‍රතිලාභ ලබන පිරිස දැන් වර්ෂයක් පාසා දහස් වරකින් වැඩි වී ඇති අතර, දිනෙන් දින අඛණ්ඩව වර්ධනය වෙමින් පවතී.

ස්වීඩන ප්‍රභවයේ නිර්මාතෘවරුන් විසින් මානව හිමිකම් අයතනයේ කාර්යභාරයට ඇතුලත් කර නොතිබුණි. කෙසේවෙතත්, ඔම්බුඩ්ස්මන් සංකල්පය ලොවපුරා ක්‍රියාත්මක වීම ආරම්භවීමත් සමඟ, සම්ප්‍රදායිකව ඔම්බුඩ්ස්මන් ආයතනය ජනතා මානව හිමිකම් සුරකින්නකු සහ ආරක්ෂකයකු වශයෙන් ක්‍රියා කළ යුතුය යන මතයක් ගොඩ නැඟුණි. කීත් විසින් ඉදිරිපත් කර ඇති ආකාරයට "යහපාලනය සැබැවින්ම අත්‍යවශ්‍ය මානව හිමිකමකි". නොමනා පාලනය හේතුවෙන් අත්‍යවශ්‍ය මානව හිමිකම් කඩවීමක් සිදුවිය හැකි බැවින්, පරිපාලන ක්‍රියාවලියේ අධීක්ෂක වශයෙන් ඔම්බුඩ්ස්මන් ආයතනය සතු ප්‍රධානතම කාර්යය බොහෝවිට මානව හිමිකම් සංරවකයකින් සමන්විතය. නැගෙනහිර යුරෝපයේ සහ මධ්‍යම ආසියාතික පශ්චාත් කොමියුනිස්ට් රාජ්‍යයන්හි අළුතින් ස්ථාපනය කරන ලද ආයතන බොහොමයක්, මානව හිමිකම් ආරක්ෂා කිරීම සඳහා නිශ්චිත බලතල වලින් සමන්විතය. ඔවුන් සතුව මානව හිමිකම් ආරක්ෂා කිරීම සඳහා නිශ්චිත බලතල පවරා නොතිබුණද, ඔම්බුඩ්ස්මන්ගේ භූමිකාවෙහි වැදගත්කම සම්බන්ධව මානව හිමිකම් පිළබඳ එක්සත් ජාතීන්ගේ මහ කොමසාරිස්වරයා විසින් වරක් අවධාරණය කරන ලදි. එය "මානව හිමිකම් කඩවීම් මර්දනය" කිරීම සඳහා රාජ්‍යයන් සතු බැඳීම සහ " දුර්වල, අක්‍රීය පාලන ආයතන" ආමන්ත්‍රණයට ඔම්බුඩ්ස්මන් සතු කාර්යය අතර සම්බන්ධකය බව නිරීක්ෂණය වේ.

ඔම්බුඩ්ස්මන්ගේ භූමිකාව පිළබඳ එක්සත් ජාතීන්ගේ මහ මණ්ඩල යෝජනා 63/169 හි සඳහන් වන පරිදි, නීතියේ ආධිපත්‍ය, සාධාරණයේ මූලධර්ම හා සමානාත්මතාවයන් ඔවුන්ගේ කාර්යයන්හිදී අදාල ප්‍රමිතීන්ට අනුගත විය හැකි අයුරින් ඔම්බුඩ්ස්මන් සතු බලතල සැකසීමේදී මානව සම්පත් පිළබඳ ප්‍රමිතීන් පිළිබිඹු වන අයුරින් සැකසිය යුතුය. ඵලදායී පිළයම් යෙදීම ඇතුළුව සාධාරණත්වයට ළඟාවිය

හැකි බව, අධිකරණයට ළඟා විය හැකි බව, සාධාරණ සමේෂණය, සහන, අධිකරණ ආරක්ෂාව, නියමිත ක්‍රියාවලිය, නෛතික නියතභාවය, අනිසි ප්‍රමාදය, සාධාරණ කාලය සහ වෙනස් ලෙස නොසැලකීම මෙම ප්‍රමිතීන්ගෙන් කොටසක් වේ. යෝජනාවලිය මඟින් "ඔම්බුඩ්ස්මනගේ ස්වාධීනත්වයේ සහ ස්වෛරීභාවයේ වැදගතකම ගෙනහැර දක්වන අතර, අන්තර්ජාතික මානව හිමිකම් බැඳීම් වලට අනුගත වෙමින් ජාතික ව්‍යවස්ථාදායකය සහ ජාතික ප්‍රතිපත්ති සම්පාදනය කිරීම සඳහා රජයට උපදෙස් දීම මඟින්" මෙම ආයතන වලට සක්‍රීය දායකත්වයක් ලබා දිය හැකි බව අවධාරණය කරයි.

ඔම්බුඩ්ස්මන්ගේ භූමිකාව පිළබඳ එක්සත් ජාතීන්ගේ මහ මණ්ඩල යෝජනා 65/207 මඟින් යෝජනා 63/169 හි සඳහන් කරුණු නැවත නැවතත් ඉස්මතු කරන අතර, ජාත්‍යන්තර ඔම්බුඩ්ස්මන් ආයතනයේ කාර්යයන්හි තෘප්තිමත්භාවය, "ස්වාධීන සහ ස්වෛරී ඔම්බුඩ්ස්මන්වරයකු ශක්තිමත් කිරීම සලකා බැලීම" සඳහා රාජ්‍යයන් පොළොඹවමින්, "පැරිස් මූලධර්ම වලට අනුකූලව යෝග්‍ය ලෙස ක්‍රියා කිරීම" සඳහා ඔම්බුඩ්ස්මන්වරයා පොළොඹවයි.

මෙම යෝජනාවලියෙහි "රජය පරිපාලනයේදී, යහපාලනය ප්‍රවර්ධනය කිරීම සඳහා" ඔම්බුඩ්ස්මන් විසින් ඉටුකරන භූමිකාව පිළිබඳවද සඳහන් වේ. "යහ පාලනය" යනු විනිවිදභාවයෙන් යුක්ත, සාධාරණ, සර්වග්‍රාහී සහ නියෝජනාත්මක තීරණ ගැනීමේ ක්‍රියාවලියක් බවත්, පරිපාලනය එම තීරණ කුමන ක්‍රමවේදයක් මඟින් ක්‍රියාවට නංවන්නේද යන්නත් අවබෝධ වේ. මෙම තීරණ ක්‍රියාවට නැංවීම අධීක්ෂණය සඳහා ඔම්බුඩ්ස්මන් ආයතන වැදගත් වේ.

මීට අමතරව, සාම්ප්‍රදායික අධිකරණ පද්ධතියේ ඇති සීමාවන් මැඩ පැවැත්වීමටත් ඔම්බුඩ්ස්මන් ආයතන උපකාරී වේ; "රජයත්, එමඟින් පාලනය කරනු ලබන පාර්ශ්වත් අතර ආවේනික බල අසමතුලිතතාවයක් පවතී". කෙසේ වෙතත්, මෙම ව්‍යුහාත්මක ගැටළුවට විසඳුම් සෙවීමට සාම්ප්‍රදායික අධිකරණ පද්ධතියට නොහැකිය. අධිකරණයට හෝ විනිශ්චය සභාවක් වෙත යොමුවීම ප්‍රමාණවත් තරම් මුදල් තිබීම මත රඳාපවතින අතර, සහන ලබා ගැනීම සඳහා වාර කිහිපයක් අවශ්‍යය වන බැවින්, කාලය යන සාධකයද මෙයට එකතු වේ. ඉතාමත් හොඳ නීති ආධාර පද්ධතියකට වුවද මෙම කරුණු සහමුලින්ම අහෝසි කළ නොහැක. අනෙක් අතින් ගත්කළ, "රජය සතුව සෑමවිටම අවදානමක් ගත හැකි වන අයුරින් සම්පත් සමූහයක් පවතින බැවින්" කාලය ගැටළුවක් නොවේ. තවද, වසර ගණනාවක් තිස්සේ ලැබෙන පැමිණිලි සංඛ්‍යාව පදනම් කරගෙන සංස්ථනික ගැටළු පෙන්වා දීමට ඔම්බුඩ්ස්මන්වරයා සතුව බලතල පවතින බැවින්, පරිපාලනයේ පවතින අඩුලුහුඩුකම් ආමන්ත්‍රණය සඳහා බොහෝ විට ඔම්බුඩ්මන්වරයා අධිකරණයට වඩා ඵලදායී වේ. එසේම, එය වඩාත් නම්‍යශීලී සහ පිරිවැය-ඵලදායී ක්‍රමවේදයකි. මීට අමතරව, ඔම්බුඩ්ස්මන් ආයතනය විශේෂයෙන්ම ජනගහනයෙහි

සිටින වැඩි අවදානම් සහිත කණ්ඩායම් වලට සාමාන්‍යයෙන් අඩු ආරම්භක ප්‍රවේශයක් ලබා දෙන අතර මෙමඟින් "පිළියම් සෙවීම සඳහා ඔවුන් සතු හැකියාව වඩාත් ශක්තිමත් කරන බැවින්", සම්ප්‍රදායික අධිකරණ පද්ධතියකට වඩා වාසි සහගතය.

ශ්‍රී ලංකාවේ ඔම්බුඩ්ස්මන් කාර්යාලයක අවශ්‍යතාව පිළිබඳව ප්‍රථම වරට සාකච්ඡාවට භාජනය වූයේ 1966 ජනවාරි මාසයේ පැවති අග්නිදිග ආසියානු විනිසුරුවන්ගේ සම්මේලනයේදී ය. පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස් ධූරය (ඔම්බුඩ්ස්මන්) ස්ථාපනය කිරීම සඳහා 1978 ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 156 වන වගන්තියෙන් පාර්ලිමේන්තුවට බලය පවරා දෙනු ලැබීය. එම ධූරය ස්ථාපනය කරමින් එම ධූරයේ බලතල, වගකීම් හා කාර්යයන් අර්ථ නිරූපනය කළ 1981 අංක 17 දරන පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස් පනත පාර්ලිමේන්තුව විසින් සම්මත කරනු ලැබීය. මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කිරීම් පිළිබඳව හෝ වෙනත් අසාධාරණ සම්බන්ධයෙන් හෝ මහජනතාව වෙතින් ඔම්බුඩ්ස්මන්වරයාට සෘජුව ලැබෙන චෝදනා හෝ පැමිණිලි, මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට දැනුම් දීමට යටත්ව සලකා බැලීමට ඔම්බුඩ්ස්මන්වරයාට 1994 අංක 26 දරන පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස් (සංශෝධන) පනතින් අදාල මුල් පනතේ 10 වන වගන්තිය සංශෝධනය කරමින් බලය පවරා තිබේ.

පුරවැසියන්ගේ දුක්ගැනවිලි වලට සහනයක් ලබා දෙන්නාවූත්, ඔවුන්ගේ මූලික අයිතිවාසිකම් ආරක්ෂා කරන්නාවූත්, ගරුත්වය නැවත ලබා දෙන්නාවූත්, එමෙන්ම ප්‍රජාතාන්ත්‍රික ක්‍රියාවලිය තුළ විශ්වාසය තහවුරු කරන්නාවූත්, ස්වාධීන, අපක්ෂපාතී, ලාභදායි ආරාවුල් විසඳීමේ යාන්ත්‍රණයකට ප්‍රවේශ වීමට පුරවැසියන්ට හැකියාව ලබා දෙන්නා වූ වේදිකාවක් ඔම්බුඩ්ස්මන් ක්‍රමය මඟින් සපයනු ලැබේ.

පරීක්ෂණ සිදුකළ පැමිණිලිවලින් බොහොමයක් දෙපාර්තමේන්තුවකට හෝ රජයට හෝ සංස්ථා, මණ්ඩල වැනි පාර්ලිමේන්තුවෙන් පනවනු ලැබූ නීතිවලට අනුකූලව කටයුතු කළ යුතු ව්‍යවස්ථාපිත අධිකාරියකට එරෙහිව හෝ, ඉතා වැදගත් වූ කරුණු සම්බන්ධයෙන් ඉදිරිපත් වූ ඒවා බව තහවුරු විය. එමෙන්ම ආයතන සංග්‍රහයේ ඇතුලත් උපකාරක නීති හා රෙගුලාසි අනුව කටයුතු කිරීමට අපොහොසත් වීම හා සම්බන්ධ ඒවා ය. ඇතැම් විටෙක, නීති රෙගුලාසිවලින් නියම කර ඇති ක්‍රියා පටිපාටි පිළපදින ලෙස අත්පොත්වල නිර්දේශ කර තිබුණද, ඒවා අනුගමනය කර නොතිබිණි.

රාජ්‍ය ප්‍රතිපත්ති හා ක්‍රියා පටිපාටි සාධාරණ ලෙස හා සමානාත්මතාවයෙන් යුක්තව ක්‍රියාවට නැංවීමට බැඳී සිටින පරිපාලකයන්ගේ සහ බලධාරීන්ගේ නොසැලකිලිමත්භාවය හේතුවෙන් පැමිණිලිකරුට මුහුණ දීමට සිදු වූ ගැහැට පිළිබඳ දුක්ගැනවිලි ද ඇතැම් පැමිණිලිවල ඇතුලත් ය. තවද, ප්‍රතිපත්ති හෝ ක්‍රියාපටිපාටි අනුගමනය කරන අවස්ථාවලදී ද, අනවබෝධය හා අනම්‍යශීලිභාවයද පැවති බව නිරීක්ෂණය විය.

නිරන්තරයෙන් පැමිණිලි ඉදිරිපත් කිරීමට බලපාන්නා වූද, ඉතා පහසුවෙන් ඉවත් කළ හැකි වූද එක් හේතුවක් වන නිලධාරිවාදය පිළිබඳ අසංවේදීතාව රජයේ දෙපාර්තමේන්තු හෝ ව්‍යවස්ථාපිත ආයතනවල පවතී. ලිපිවලට විධිමත්ව පිළිතුරු නොසැපයීම, සේවලාභීන් විසින් හෝ අසාධාරණයට ලක් වූ නිලධාරීන් විසින් කරනු ලබන විමසීම් වලට පිළිතුරු ලබා නොදීම, පුද්ගලයින්ට ආචාරශීලි නොවීම බොහෝ පෙත්සම්කරුවන් විසින් පිළකුලට ලක්කර තිබුණි.

රජයේ නිලධාරීන් නොසැලකිලිමත් ලෙස හැසිරීමෙන් වැලකිය යුතුය. එය වඩා යහපත් නිවැරදි පරිපාලනයේ අත්‍යවශ්‍ය සංරචකයක් වන මහජන සම්බන්ධතාවයට දායක වනු ඇත. රාජ්‍ය අංශයේ බොහෝ කොටස් වල මහජන සම්බන්ධතා නොමැතිවීම අවධානයට ලක්විය යුතු කරුණකි. පරිපාලනයේ ඉතා වැදගත් අංගයක් වන තොරතුරු, අවශ්‍ය අවස්ථාවේදී නොසැපයීම, නිලධාරීන්ගේ පාර්ශ්වයෙන් දක්වන නොසැලකිල්ල හෝ උදාසීනත්වය මත රඳා පවතී.

පරීක්ෂණයක හෝ විමර්ශණය කිරීමක නිරතව සිටින ඕනෑම විටක ආරවුලට සම්බන්ධ ගැටළුවෙහි යුක්තියුක්තභාවය හෝ සාධාරණත්වය පිළිබඳ අවබෝධ කර ගැනීමට නිසි සැලකිල්ල යොමු නොකර, නිලධාරියා තම තීරණය හෝ ක්‍රියාමාර්ගය සාධාරණීකරණය කිරීම සඳහා කාලයත්, ශ්‍රමයත් වැය කරයි. සිදු කළ වරදේ බරපතලකම සහ එහි හානිකර බලපෑමත්, තමන්ට එරෙහිව එල්ල වන පැමිණිලිත් නොසලකමින් නිලධාරීන් දිගින් දිගටම එවැනිම වැරදි ක්‍රියාමාර්ග හා සාවද්‍ය තීරණ ගැනීමෙහි නිරත ව සිටින බව පෙනේ.

ඉහත සඳහන් සියලු දුෂ්කරතා මධ්‍යයේ, ලැබෙන පැමිණිලිවලින් සැලකිය යුතු ප්‍රමාණයක කටයුතු අවසන් කිරීමට අප කාර්යාලය සමත් විය. කාර්යාලයේ අනුමත කාර්ය මණ්ඩලය සම්පූර්ණව නොමැති අතර ගණකාධිකාරිවරයෙකු හෝ පොත් තබන්නෙකු හෝ මෙම කාර්යාලයට පත් කර නොමැත. නිලධාරීන් මෙම කාර්යාලයේ සේවය කිරීමට අකමැත්තක් දක්වන බවද සැලකිල්ලට ගත

යුතුය. ප්‍රමාණවත් ලෙස අතිකාල සේවයේ යෙදීමට හෝ වෙනත් කාර්යාලවලට අදාලව ගෙවනු ලබන අමතර දීමනා ලැබීමට අවස්ථාවක් නොලැබීම වැනි කරුණු මීට බලපා ඇත.

සංඛ්‍යාලේඛනාත්මක විශ්ලේෂණය.

2017 වසර තුලදී විමර්ශනය කිරීම සහ වාර්තා කිරීම සඳහා පාර්ලිමේන්තු පෙත්සම් කාරක සභාව මගින් යොමු කරන ලද පැමිණිලි 70ට අමතරව මහජනතාවගෙන් සෘජුව පැමිණිලි 1310 මෙම කාර්යාලයට ලැබිණ. 2016 අවසන පැමිණිලි 457 පරීක්ෂණ සඳහා ඉතිරිවීම මත 2017 වසර තුලදී සමාලෝචනය සඳහා පැමිණිලි 1837 පැවතිණ.

මෙම පැමිණිලි වලින් බහුතරයක් විභාග කරන ලද අතර, කෙටි කාලයක් ඇතුලත මහජන පෙත්සම් කාරක සභාවට ඉදිරිපත් කරන ලදී. මෙම කාර්යාලයෙන් ඉදිරිපත් කරන ලද සියලුම නිර්දේශ කාරක සභාව මගින් පිළිගෙන ඒ අනුව කටයුතු කරන ලද බව සඳහන් කළ යුතුය.

ලඝු වශයෙන් පැමිණිලි 1197ක් ද, අන්තර්පාර්ශව ලෙස පැමිණිලි 24ක් ද විමර්ශනය කර, සම්පූර්ණ වශයෙන් පැමිණිලි 1221ක් අවසන් කරන ලදී. 2017 වසර තුලදී පැමිණිලි 616ක් අවසන් නොවී 2018 යොමුවිය.

පැමිණිලි වලට අදාල කරුණු සම්බන්ධයෙන් ක්‍රියාකිරීම නිලධාරින් විසින් අනවශ්‍ය ලෙස ප්‍රමාද කරන අවස්ථා වැනි සිදුවීම් වලදී අදාල රාජ්‍ය නිලධාරින් දුරකථන මාර්ගයෙන් හෝ ලිඛිතව සම්බන්ධ කරගනිමින් ඒවා හැකි ඉක්මණින් නිරාකරණය කිරීමට මෙම කාර්යාලය උත්සාහ කර තිබේ. බොහෝ පැමිණිලි සිරිතක් ලෙසට අතිගරු ජනාධිපතිතුමාගේ, අග්‍රාමාත්‍යතුමාගේ, අමාත්‍ය මණ්ඩල අමාත්‍යවරුන්ගේ සහ අනෙකුත් සංවිධාන වලට යොමු කරමින් අවධානය පිණිස ඔම්බුඩ්ස්මන් වෙත පිටපත් ඉදිරිපත් කරන දුක්ගැනවිලි වලින් සමන්විත වේ. මෙම ක්‍රියාවලිය හේතුවෙන් එක් පැමිණිල්ලක් පිළිබඳ ආයතන කිහිපයක් තම කාලය සහ සම්පත් වැය කරමින් සමහර අවස්ථාවලදී පරස්පරනිර්දේශ ඉදිරිපත් කිරීම නිසා ඒ සම්බන්ධව ක්‍රියාකිරීමට අදාල නිලධාරියා ව්‍යාකූල තත්ත්වයකට පත් වේ. මේ නිසා මෙම කාර්යාලය අනෙකුත් ආයතනය වෙත යොමු කරන පැමිණිලිවල පිටපත් සම්බන්ධයෙන් සලකා නොබලයි. තවත් සමහර පැමිණිලි මගින් විභාග කිරීම ආරම්භ කිරීමට ප්‍රමාණවත් තරම් තොරතුරු ඉදිරිපත් නොවේ. උදාහරණයක් වශයෙන් යම් ස්ථානයකින් ස්ථාන මාරුවක් ලබාගැනීමට හෝ එම ස්ථානයේ රැඳී සිටීමට ඉල්ලා සිටින විට එම ස්ථාන මාරුව ලබාදීමට හෝ එම ස්ථානයේ රැඳී

සිටිමේ කාලය දිර්ඝ කිරීම ලබා නොදීම සම්බන්ධයෙන් චෝදනා කරන විට එම ස්ථානයේ කොපමණ කලක් සේවය කලේද යන්න ඉදිරිපත් නොකරයි. සමහර පැමිණිලි වලදී, උදාහරණයක් ලෙස සුදුසුකම් නොමැතිව පත්වීමක් ඉල්ලා සිටින විට වැනි අවස්ථාවලදී විභාග කිරීමට තරම් අසාධාරණයක් බැලූ බැල්මට නොපෙනේ. සහනයක් ඉල්ලීමේ, අනවශ්‍ය ප්‍රමාදය ද පැමිණිලි ප්‍රතික්ෂේප වීමට හේතුවක් වේ.

උදාහරණයක් ලෙසට සේවය හැර ගිය පුද්ගලයකුගේ ඉල්ලීමක්, අතිවිශේෂ හේතු නොමැත්තේ නම්, මාස 03ක් ඇතුලතදී, එම තනතුරේ නැවත පිහිටුවීමට ඉල්ලුම් කළ යුතුය. පුද්ගලික ආරවුල් සහ අධිකරණ විසින් විමර්ශන කරන ගැටලු ඔම්බුඩ්ස්මන්ගේ රාජකාරියට ඇතුලත් නොවේ.

එසේම විදුහල්පතිවරුන්ගේ සහ ගුරුවරුන්ගේ මාරුවීම්, වැටුප් වර්ධක, උසස්වීම්, හිඟ වැටුප්, දීමනා සහ විශ්‍රාම වැටුප් සම්බන්ධයෙන් විශාල අභියාචනා ප්‍රමාණයක් යොමු වී තිබිණ. සමහර අවස්ථාවලදී නියමිත වේලාවට එම ආයතන මගින් වාර්තා ලබාගැනීම අසීරු වී ඇත. පාසල් වලට ළමුන් ඇතුළත් කිරීම සම්බන්ධයෙන් ද දෙමාපියන් චෝදනා ඉදිරිපත් කර තිබේ.

ලිඛිත පරීක්ෂණයෙන් විදුහල්පති ශ්‍රේණි සඳහා ප්‍රමාණවත් ලකුණු ලබා තිබියදීත් පත්වීම් ප්‍රදානය අසාධාරණ වීම සම්බන්ධයෙන් එම විභාගයට පෙනී සිටි ගුරුවරුන්ගෙන් විශාල සංඛ්‍යාවක් පැමිණිලි ලැබී තිබිණ.

සමහර ආයතන, වාර්තා කැඳවූ විට එකී වාර්තා ඉදිරිපත් කිරීම අනලස්ව සිදු නොකරන බව පෙනීයාම කණගාටුවෙන් හෝ සඳහන් කලයුතුය. එකී ආයතන අතර, මහවැලි අධිකාරිය, සෞඛ්‍ය අමාත්‍යාංශය සහ විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව ප්‍රධාන වේ.

එකී ප්‍රශ්නය අමතරව, මහවැලි අධිකාරිය සහ විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව ඔවුන් මුලින් ගෙන ඇති තීරණ වෙනස් කිරීමට කෙලෙසකින් සහ/හෝ අකැමැත්තක් ඇති බවට පෙනි යයි. මෙවැනි ආයතන වලින් සහනයන් බලාපොරොත්තුව පැමිණෙන අසරණ ජනතාවට මෙවැනි ක්‍රියාකාරකම්, සෘජුව බලපානු ලබයි. උදාහරණයක් ලෙසට අදාල පරීක්ෂණයක් සම්බන්ධව මහවැලි කලාප අධ්‍යක්ෂකවරයාම පෙනී සිටීමට දැන්වූ විට, ඉදිරිපත් කරනු ලැබුවේ ඉඩම් නිලධාරීවරයෙකි. දෙපාර්තමේන්තු ප්‍රධානීවරයාගේ උපදෙස් අනුව කටයුතු කරන බව පෙන්වමින් මෙම නිලධාරියා අදාල පරීක්ෂණයේදී කිසිම සාධාරණ තීන්දුවකට එළඹීමට එකඟ නොවුයේ, රජයේ නිලධාරියකු ලෙස සිය

හැසිරීමටද නිහා කරමිනි. මෙම නිලධාරිවරයාගේ හැසිරීම, මෙම ආයතනයේ මූලික පරමාර්ථ සහ රාජකාරි කටයුතු අවදානම් තත්ත්වයකට පත් කරන ලදී.

හැකියාවෙන් පරිපූර්ණ අධ්‍යක්ෂ ජනරාල්වරයකු යටතේ වසර කිහිපයකට පෙර දක්වා විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව ඔවුන්ගේ රාජකාරි කටයුතු යහපත් අන්දමකට සිදුකරන ලදී. එහෙත් ඉහත තත්ත්වය දැනට පහතට කඩා වැටී ඇති අතරම, ඒ අනුවම මෙම ආයතනයට සැලකිය යුතු ප්‍රමාණයක පැමිණිලි එක්වීම සිදු වේ. මෙහිදි මතකයට ගතයුතු කරුණක් වනුයේ නිලධාරින්, නීතිරාමුව මතම යැපෙමින් කටයුතු කිරිම හැර විවෘත හදවතක් සහිතව, සහ තනතුරක් ලැබූ පමණින් හිතුමතේම ක්‍රියා නොකිරිමට අධිෂ්ඨාන කරගත යුතු බවටය.

දරුවන් පාසැල්වලට ඇතුලත් කිරිම සම්බන්ධයෙන් ගන්නා නව විධිවිධාන සම්බන්ධයෙන් ගරු අධ්‍යාපන අමාත්‍යතුමා සහ ඔහුගේ කාර්යක්ෂම ලේකම්වරයා කටයුතු කිරිම ප්‍රසංසාවට ලක්විය යුතුය. ඒ සමග විදුහල්පතිවරුන්ගේ සහ ගුරුහවතුන්ගේ ස්ථාන මාරුවීම් සහ උසස්වීම් සම්බන්ධයෙන් ද සාධාරණව කටයුතු සිදුවනු ඇතැයි බලාපොරොත්තු වෙමි. තවද එකම පාසැලක දිර්ඝ කාලයක් සේවය කරන ගුරුහවතුන් ස්ථාන මාරුකිරිමට අදාල පරිපාටියන්ට අනුව තරයේම සිදුවිය යුතු බවටද සඳහන් කරමි. මේ සම්බන්ධයෙන් ගරු අමාත්‍යතුමා සහ අමාත්‍යාංශය ගන්නා තීන්දු වෙනස් කිරීමට කිසිවකුට ඉඩ නොදිය යුතු අතරම, ලේකම්තුමා ඔහුගේ අමාත්‍යාංශය තුල ගැවසෙන ඉතා අල්ප වුවත් අදාල දූෂිත නිලධාරින් සම්බන්ධයෙන් විමසිල්ලෙන් සිටිම වැදගත් බවටත් සඳහන් කරමි.

ජනවාර්ගික හා ආගමික සහජීවනය රැකගැනීම උදෙසා ප්‍රතිපත්ති සම්පාදකවරු දැඩි උනන්දුවකින් කතා කලත් දැනට ජනවාර්ගිකත්වය හා ආගම් පදනම් කොට හුදෙකලා වි සිටින පර්ෂද පාසල් සංකල්පයෙන් මිදී ලාබාල වියේදීම විවිධ පසුබිම්වලින් පැමිණි සිසුන් එකට එක්කිරිම සිදුකල හැකි අතර, විවිධ ජාතීන් අතර පවතින අවිශ්වාසය අකාමකා දැමීමට එය දිගු ගමනක් වුවත්, ඒ සම්බන්ධව අමතක කර සිටීමට ඔවුන් පෙළඹී ඇත.

අසල්වාසී පදිංචිකරුවන් අපහසුතාවයට පත් කරන අන්දමට නීතිවිරෝධීව තමන්ගේ ඉඩම්වල ගොඩනැගිලි තනන්නන්ට එරෙහිව නීතිය ක්‍රියාත්මක කිරිමේදී සමහර නාගරික සභාවන් ඉතාමත් නිද්‍රාශීලි පිළිවෙත් අනුගමනය කරනු ලබයි. මෙවැනි තැනීම් ඉවත් කරන ලෙසට නිකුත් කරන ලද නිර්දේශ සම්බන්ධයෙන් බලාපොරොත්තු ප්‍රතිඵල ලබා නොදෙන ලදී.

මධ්‍යම හා පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ සේවය කරන නිලධාරින්ට එරෙහිව ලැබෙන පැමිණිලි ප්‍රමාණය ඉතා ඉහළය. ඉසුරුපායේ ඇති අමාත්‍යාංශයට හා පළාත් අධ්‍යාපන බලධාරීන් වෙත අප විසින් යවනු ලබන ලිපිවලට අදාල ප්‍රතිචාර දැක්වීම බොහෝ මන්දගාමීය. මේ නිසා අපට අවශ්‍ය වාර්තා ගෙන්වා ගැනීමට සිහිකැඳවීම් කිහිපයක් යැවීමට සිදු වේ. කෙසේවුවද, විමර්ශන සඳහා අදාල නිලධාරින්ගේ පැමිණීමේ යම් වර්ධනයක් දක්නට ඇත. යම් විදුහල්පතිවරයෙකුට තමන් අකැමැති ගුරුවරයෙකු ස්ථාන මාරුකොට යැවීමට අවශ්‍ය වූ විට අදාල ගුරුවරයාගේ කාලසටහන එම ගුරුවරයාට ලබා නොදී සිටිමින් එවැනි මාරුකිරිම් සඳහා නිර්මානය කිරිම් කරනු මා නිරීක්ෂණය කර ඇත.

පරීක්ෂණයක හෝ විමර්ෂණය කිරීමක නිරතව සිටින ඕනෑම විටක ආරවුලට සම්බන්ධ ගැටළුවෙහි යුක්තියුක්තභාවය හෝ සාධාරණත්වය පිළිබඳ අවබෝධ කර ගැනීමට නිසි සැලකිල්ල යොමු නොකර, නිලධාරියා තම තීරණය හෝ ක්‍රියාමාර්ගය සාධාරණීකරණය කිරීම සඳහා කාලයත්, ශ්‍රමයත් වැය කරයි. සිදු කළ වරදේ බරපතලකම සහ එහි හානිකර බලපෑමත්, තමන්ට එරෙහිව එල්ල වන පැමිණිලිත් නොසලකමින් නිලධාරින් දිගින් දිගටම එවැනිම වැරදි ක්‍රියාමාර්ග හා සාවද්‍ය තීරණ ගැනීමෙහි නිරත ව සිටින බව පෙනේ.

එමඟින් යහපාලනයේ වැඩිදියුණුවක් සිදු නොවන්නා සේම, රජයේ නිලධාරීන් මහජනයා කෙරෙහි ප්‍රතිවාදී ආකල්ප දැරීමෙහි අඛණ්ඩව නියුක්ත වුවහොත් නිසැවකම පරිපාලනය දූෂ්‍ය තත්වයට පත් වේ. තවද, රජයේ නිලධාරීන් සාධාරණ පැමිණිලි ඉදිරිපත් කරන පුරවැසියන් පිළිගැනීමට සහ ඔවුනට ඇහුම්කන් දීමට සූදානම් නොමැතිව ඔවුන්ව දුරස්කර ගැනීමට උත්සාහ කරන්නේ නම්, එය යහපාලනයේ දුර්වලතාවකි.

මහජන පැමිණිලි වලින් පැහැදිලි වන අන්දමට නිලධාරීන් සහ ආයතන විසින් පමණට වඩා නීතියට යටත්වීම හා විධිමත් බව පමණට වඩා පිළිපැදීම මඟින් ප්‍රමාදයන් සිදුවන බවටත්, සේවක සාධාරණත්වය සහ සාධාරණ පාලනය පැහැර හැරීම, රාජ්‍ය ප්‍රතිපත්ති ක්‍රියාපටිපාටි, රෙගුලාසි සහ රීති පිළිබඳ සාවද්‍ය අර්ථකතනය සහ සාවද්‍ය භාවිතය, ඉක්මන් අපක්ෂපාතී නිරවුල්කරණයකට මඟ පෑදීමට හැකි අයුරින් පැමිණිලිකරුවන් හමු වී ගැටළු විසඳීමට පසුබට වීම, අගතියට පත් පාර්ශවයට ඇහුම්කන් නොදී ඒකපාර්ශ්වික ක්‍රියාමාර්ග ගැනීම, සුළු ගැටළු විසඳීමට තීරණ ගැනීම ප්‍රමාද කිරීම, එදිරිවාදී ස්වභාවය, සංවේදී නොවීම සහ අසාධාරණ ක්‍රියාමාර්ගය නිසා අගතියට පත් තැනැත්තා කෙරෙහි නොසැලකිලිමත් වීම යනාදිය වැලැක්වීම ගැටළු තත්වයන් මතුවන අතර, පැමිණිලිවලට අදාලව ලබාදුන් නිර්දේශ සඳහා දෙපාර්තමේන්තු සහ අධිකාරී විසින් ක්‍රියාත්මක කිරීම ප්‍රමාද කිරීම සාමාන්‍ය පුරුද්දක් බවට පත්ව ඇත.

කලින් අවස්ථාවකදී ව්‍යවස්ථා සංශෝධනයට අදාලව, මෙම ආයතනයට සම්බන්ධව සිදුවිය යුතු සංශෝධනයන් සම්බන්ධයෙන් මාගේ අදහස් ඉදිරිපත් කරන ලෙසට දන්වා තිබූ අතර, ඒ අනුව සමාජයේ හිමිකම් අඩු අහිංසක ජනතාව වෙත ලබාදිය හැකි උසස් සේවාවන් ප්‍රධානය කිරීමේ අරමුණින් සහ මෙම ආයතනයෙන් ඉටුවිය යුතු සේවාවේ උසස්බවත්, දැනට පවත්නා තත්ත්වය වඩාත් ඉහල නැංවීමට ගතහැකි ක්‍රමවේදයන් ද මා විසින් අනුකමිටුවට ඉදිරිපත් කරන ලදී. කෙසේ වෙතත් එකී නිර්දේශ ප්‍රතික්ෂේප කරමින් අදාල සාමාජිකයන්ගේ මතය වී ඇත්තේ, මෙම ආයතනයේ නිර්දේශ, ද්විපාර්ශව පරික්ෂණයකින් පසුව නිකුත් නොකරන බැවින්, පිළිගත නොහැකි බවට ය. මෙම කරුණු සම්බන්ධයෙන් මා මැදිහත් වීමට බලාපොරොත්තු නොවුවත්, කෙටියෙන් සඳහන් කල යුත්තේ "විමසීම" යනු කුමක්ද යන්නත්, පනතේ අදාල අනිකුත් වගන්ති කෙරෙහිද අවධානය යොමු කරවීම පමණි. දෙපක්ෂයටම අදාල කරුණු ඉදිරිපත් කිරීමට මෙම ආයතනය අවශ්‍ය තරම් ඉඩකඩ සකසා දී ඇත. විශේෂයෙන් පැහැදිලි කළයුතු කරුණක් වන්නේ, නීතිඥවරුන්ට මෙම ආයතනයේ පරීක්ෂණ වලදී පෙනී සිටීමට නොහැකි වීමත්, සහ මෙම ආයතනය නිලවාදය ආරක්ෂා කිරීමට පිටුවහලක් වන ස්ථානයක් නොවීමත් ය.

සංඛ්‍යානමය විශ්ලේෂණය

2016 වර්ෂයේ ඉදිරියට ගෙනෙන ලද පරීක්ෂණ සිදුකිරීමට නියමිත ඉතිරි පැමිණිලි සංඛ්‍යාව		457	
2017.01.01 දින සිට 2017.12.31 දින දක්වා ලැබුණු මුළු පැමිණිලි සංඛ්‍යාව			
(අ) සෘජුව ලැබුණු පැමිණිලි	1310		
(ආ) විමර්ශනය කර වාර්තා කිරීම සඳහා මහජන පෙත්සම් කාරක සභාව යොමු කරන ලද පැමිණිලි	70	1380	
2017 වර්ෂය තුළ පරීක්ෂණ සිදු කිරීමට නියමිතව තිබූ මුළු පැමිණිලි සංඛ්‍යාව			1837
2017 වර්ෂය තුළ පරීක්ෂණ සිදු කරන ලද සමස්ථ පැමිණිලි සංඛ්‍යාව			
(අ) සහන සැලසීම සඳහා ඉදිරි ක්‍රියාමාර්ග ගනු ලබන පැමිණිලි			
(1) පරීක්ෂණ සිදු කිරීමෙන් තොරව සමතයකට පත්කරන ලද පැමිණිලි සංඛ්‍යාව	69		
(2) සුදුසු ක්‍රියාමාර්ගයක් ගැනීම පිණිස අදාල ආයතනය වෙත යොමු කරන ලද පැමිණිලි සංඛ්‍යාව	47		
(3) අදාල ආයතන හා දෙපාර්තමේන්තු මගින් වාර්තා කැඳවීමෙන් පසු එය පැමිණිලිකරුට දැන්වීමෙන් අනතුරුව ඉදිරි පියවර ගැනීම නවතාලූ පැමිණිලි	318		
(4) වාර්තා කැඳවීමෙන් පසු ඉල්ලීම් ඉටුවී ඇති පැමිණිලි	103		
(ආ) ලඝු ලෙස කටයුතු අවසන් කරන ලද පැමිණිලි			
(1) එකම පැමිණිල්ල සමාන්තර අධිකරණයකට/ ආයතනයකට යොමු කිරීම නිසා පරීක්ෂණ සිදුකිරීමකින් තොරව බැහැර කරන ලද පැමිණිලි සංඛ්‍යාව	127		
(2) පරීක්ෂණ සිදුකිරීමට ප්‍රමාණවත් තොරතුරු නොලද පැමිණිලි සංඛ්‍යාව	14		
(3) සහනයක් සඳහා යොමුකිරීමට හේතු නොතිබුණ පැමිණිලි	43		
(4) ඔම්බුඩ්ස්මන්වරයාගේ බලතල වලින් පරිබාහිර පැමිණිලි	75		
(5) අධික ලෙස ප්‍රමාදවීම මත ඉදිරිපත් වූ පැමිණිලි	61		
(6) සෘජුව වෙනත් ආයතන වෙත යොමු කළ ලිපිවල පිටපත් ලෙස කාර්යාලය වෙත යොමු කරන ලද පැමිණිලි	315		
(7) වෙනත් ඔම්බුඩ්ස්මන් ආයතන වෙත යොමු කරනු ලැබූ පැමිණිලි	25	1197	
පරීක්ෂණ සිදු කරන ලද සහ අන්තර් පාර්ශව විමර්ශන වලින් අනතුරුව වාර්තා කරන ලද පරීක්ෂණ සංඛ්‍යාව		24	1221

2017.12.31 දින වන විට පරීක්ෂණ පැවැත්වීමට සහ වාර්තා කිරීමට නියමිත ඉතිරි පරීක්ෂණ සංඛ්‍යාව			616

<u>මාසික විශ්ලේෂණය</u>

2017 වර්ෂයේදී ආයතනයට ඉදිරිපත්ව තිබූ සම්පූර්ණ පැමිණිලි සංඛ්‍යාව 2016 වර්ෂයේ ඉතිරියත් සමඟ 1380 විය. 2017 අප්‍රේල් මාසයේ දී කාර්යාලයට අඩුම පැමිණිලි සංඛ්‍යාව ලැබුණු අතර, එය පැමිණිලි 75ක් විය. වැඩිම පැමිණිලි සංඛ්‍යාවක් වන 162, ඔක්තෝබර් මස දී ඉදිරිපත් විය. විස්තර 2 වන වගුවේ පැහැදිලි කර ඇත.

වගුව: 2 - <u>2017 වර්ෂයේදී එක් එක් මස තුළ ලද පැමිණිලි සංඛ්‍යාව.</u>

	මාසය	පැමිණිලි සංඛ්‍යාව
01	ජනවාරි	130
02	පෙබරවාරි	100
03	මාර්තු	122
04	අප්‍රේල්	75
05	මැයි	104
06	ජූනි	87
07	ජූලි	126
08	අගෝස්තු	98
09	සැප්තැම්බර්	100
10	ඔක්තෝබර්	162
11	නොවැම්බර්	124
12	දෙසැම්බර්	152
	එකතුව	**1380**


130
100
122
75
104
87
126
98
100
162
124
152
ජනවාරි
පෙබරවාරි
මාර්තු
අප්‍රේල්
මැයි
ජූනි
ජූලි
අගෝස්තු
සැප්තැම්බර්
ඔක්තෝබර්
නොවැම්බර්
දෙසැම්බර්

වර්ෂය තුළ දී ගොනු කරන ලද පැමිණිලි 1027ක් පුරුෂ පාර්ශවය විසින් ද 353ක් ස්ත්‍රී පාර්ශවය විසින් ද ඉදිරිපත් කර ඇත. 3 වන වගුවේ විස්තර කර ඇත.

වගුව: 3 - 2017 වර්ෂයේ දී ස්ත්‍රී පුරුෂ වශයෙන් ලද මුළු පැමිණිලි සංඛ්‍යාව.

මාසය	පුරුෂ	ස්ත්‍රී	එකතුව
01. ජනවාරි	103	27	130
02. පෙබරවාරි	77	23	100
03. මාර්තු	88	34	122
04. අප්‍රේල්	60	15	75
05. මැයි	74	30	104
06. ජූනි	71	16	87
07. ජූලි	91	35	126
08. අගෝස්තු	69	29	98
09. සැප්තැම්බර්	69	31	100
10. ඔක්තෝබර්	119	43	162
11. නොවැම්බර්	93	31	124
12. දෙසැම්බර්	113	39	152
	1027	**353**	**1380**

දිස්ත්‍රික්ක විශ්ලේෂණය

2017 වර්ෂය තුළ වැඩිම පැමිණිලි සංඛ්‍යාවක් ලැබී ඇත්තේ කොළඹ දිස්ත්‍රික්කයෙන් වන අතර, එය 164කි. අනතුරුව වැඩිම පැමිණිලි සංඛ්‍යාව ලෙස ගාල්ල දිස්ත්‍රික්කයෙන් පැමිණිලි 142ක් ද, මහනුවර දිස්ත්‍රික්කයෙන් පැමිණිලි 123ක් ද ලැබුණි.

වගුව: 4 පැමිණිලිකරුවන්ගේ නිත්‍ය පදිංචි දිස්ත්‍රික්කය අනුව කරන ලද වර්ගීකරණයට අනුව 2017 වර්ෂයේදී ලද මුළු පැමිණිලි සංඛ්‍යාව.

දිස්ත්‍රික්කය	2017 වර්ෂයේදී ලද පැමිණිලි සංඛ්‍යාව
කොළඹ	164
ගම්පහ	93
කළුතර	88
මහනුවර	123
මාතලේ	40
නුවරඑළිය	31
ගාල්ල	142
මාතර	101
හම්බන්තොට	51
යාපනය	14
මන්නාරම	02
වවුනියාව	05
මුලතිව්	02
කිලිනොච්චි	03
මඩකලපුව	31
අම්පාර	36
ත්‍රිකුණාමලය	18
කුරුණෑගල	115
පුත්තලම	24
අනුරාධපුරය	63
පොළොන්නරුව	54
බදුල්ල	46
මොණරාගල	16
රත්නපුර	71
කෑගල්ල	46
විදේශීය	01
එකතුව	**1380**


2017 වර්ෂයේදී ලද පැමිණිලි සංඛ්‍යාව
164
93
88
123
40
31
142
101
51
14
31
36
18
115
24
63
54
46
16
71
46
1
කොළඹ
ගම්පහ
කළුතර
මහනුවර
මාතලේ
නුවරඑළිය
ගාල්ල
මාතර
හම්බන්තොට
යාපනය
මන්නාරම
වවුනියාව
මුලතිව්
කිලිනොච්චි
මඩකලපුව
අම්පාර
ත්‍රිකුණාමලය
කුරුණෑගල
පුත්තලම
අනුරාධපුරය
පොළොන්නරුව
බදුල්ල
මොණරාගල
රත්නපුර
කෑගල්ල
විදේශීය

විෂය විශ්ලේෂණය

2017 වර්ෂය තුළ දී කාර්යාලවලට සේවකයන් පත්කිරීම, සේවය අවසන් කිරීම, උසස්වීම්, වැටුප් විෂමතා, වැටුප් වර්ධක, හිඟ මුදල්, රජයේ සේවකයන් මෙන්ම පොලිස් නිලධාරීන් විසින් බලය අනිසි ලෙස යෙදවීම, විශ්‍රාම වැටුප්, සේවක අර්ථසාධක අරමුදල් ගෙවීම, අනවසර ඉදිකිරීම් සහ හිරිහැර යන කරුණු සම්බන්ධයෙන් සැලකිය යුතු පැමිණිලි ප්‍රමාණයක් ලැබී තිබුණි.

5 වගුව 2017 වර්ෂය තුළ විෂයානුගතව මහජන නිලධාරීන්ට විරුද්ධව ලැබූ පැමිණිලි මුළු සංඛ්‍යාව

2017

01	සේවා අන්තර්ග්‍රහණය කිරීම්, බඳවා ගැනීම්, පත්වීම්, ස්ථිර කිරීම්, පෙරදාතම් කිරීම්	134
02	සේවය අවසන් කිරීම්, නැවත සේවයේ පිහිටුවීම්, දීර්ඝ කිරීම්, කාර්යක්ෂමතා කඩඉම්	118
03	උසස්වීම්, ජ්‍යෙෂ්ඨත්වය	71
04	ඉඩම් බලපත්‍ර, රජයේ ඉඩම් ප්‍රදානය	99
05	ප්‍රමාදය, නොහැකියාව, නොසලකා හැරීම, බලය අනිසි ලෙස භාවිත කිරීම	126
06	වැටුප් විෂමතා, වැටුප් වර්ධක, හිඟ මුදල්, දීමනා	101
07	විශ්‍රාම වැටුප්, වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප	96
08	වන්දි ගෙවීම, දුප්පතුන්ට සහනාධාර, සමෘද්ධි	52
09	සේවා ස්ථානයෙන් මාරු කිරීම	70
10	සුනාමි සහනාධාර	02
11	විශ්ව විද්‍යාල/පාසැල් වලට ඇතුලත් වීම, විභාග ප්‍රතිඵල	96
12	සේවක අර්ථසාධක අරමුදල, සේවක භාරකාර අරමුදල, පාරිතෝෂික දීමනා	24
13	පොලිසිය බලය අනිසි ලෙස භාවිත කිරීම/අක්‍රිය වීම	19
14	අනවසර ඉදිකිරීම්/පීඩාවන්	50
15	ණය, අයකිරීම්, නැවත උපලේඛනගත කිරීම	11
16	බලපත්‍ර, ගොඩනැගිලි අවසර පත්‍ර	37
17	විදුලිය, ජලය, දුරකතන සම්බන්ධ කිරීම් හා විසංධි කිරීම්	14
18	සේවා ස්ථානයේ දී වන හිරිහැර	37
19	මාර්ග පද්ධති	42
20	විවිධ	181
	මුළු ගණන	**1380**

අමාත්‍යාංශ/ මහජන ආයතන විශ්ලේෂණය

රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය යටතේ වූ ආයතන (263) අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය (218) යන අමාත්‍යාංශවල නිලධාරීන්ට එරෙහිව පැමිණිලි විශාල සංඛ්‍යාවක් ලැබී ඇත.

රජයේ ඉඩම් බලපත්‍ර සහ ප්‍රදානයන් නිකුත් කිරීම් වලට අදාලව ප්‍රාදේශීය ලේකම්වරුන්ට එරෙහිව පැමිණිලි වැඩි ප්‍රමාණයක් ලැබී ඇත.

අනුප්‍රාප්තිය සම්බන්ධ නීතිය පැහැදිලිව පනතෙහි දක්වා තිබුණද, භුක්තිය හා පදිංචිය පිළිබඳ ගැටලු විසඳීම එතරම් සරල නොවේ. එසේම, විමර්ශන වලදී පැහැදිලි වී ඇත්තේ, ප්‍රාදේශිය ලේකම් කාර්යාලවල සේවය කරන ඇතැම් නිලධාරීන් ඉඩම් සංවර්ධන ආඥා පනතේ විධිවිධාන යටතේ අවසරපත්/ප්‍රදානයන් නිකුත් කිරීමේදී පිළිගතහැකි මට්ටමකට කටයුතු නොකරන බවට ය. තවද පිටස්තර පුද්ගලයින්ගේ අනවශ්‍ය මැදිහත්වීම් ද, නිසි ප්‍රතිඵල සම්බන්ධයෙන් බලපෑ අවස්ථා වාර්තා වී ඇත.

වගුව 6 අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, අධිකාරි සහ රජයේ ආයතන වල නිලධාරීන්ට විරුද්ධව ලැබූ පැමිණිලි සංඛ්‍යාව - 2017

අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, අධිකාරි ආදී ...	සංඛ්‍යාව 2017
රාජ්‍ය පරිපාලන	263
අධ්‍යාපන හා උසස් අධ්‍යාපන	218
සංස්ථා, අධිකාරී (CPC, CEB, SLAA, RDA)	63
රාජ්‍ය සේවා කොමිසම (මධ්‍යම සහ පළාත්)	36
ආරක්ෂක සහ අභ්‍යන්තර ආරක්ෂක	59
පළාත් සභා හා පළාත් පාලන ආයතන	208
ගමනාගමන (SLCTB, CGR, CMV)	38
සෞඛ්‍ය සහ දේශීය වෛද්‍ය	67
කම්කරු	07
මුදල්	17
කෘෂිකර්ම	29
රජයේ බැංකු	19
විශ්‍රාම වැටුප්	74
අධිකරණ	19
වාරිමාර්ග සහ මහවැලි අධිකාරිය	31
තැපැල් සහ විදුලි සංදේශ	18
සමාජ සේවා/ සමෘද්ධි/ තැනැත්තන්, දේපල හා කර්මාන්ත පුනරුත්ථාපන අධිකාරිය	08
ඉඩම් සහ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිසම	37
සමුපකාර සංවර්ධනය	14
ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය	07
රෙජිස්ට්‍රාර් ජනරාල්	04
වන සංරක්ෂණ	08
වැව්ලි	03
වෙනත්	133
මුළු	**1380**

කාර්ය මණ්ඩලය

මෙම කාර්යාලයට අනුමත සේවක සංඛ්‍යාව 32කි. පහත දක්වා ඇති සංවිධාන ධූරාවලියේ පෙන්වා ඇති පරිදි 2017 වසරේ අවසානය වන විට මෙම කාර්යාලයට අනුයුක්ත කර තිබුණේ නිලධාරීන් 20 දෙනෙකු පමණි.

සංවිධාන ධූරාවලිය

ඔම්බුඩ්ස්මන්

භාෂා පරිවර්තක (දෙමළ/ඉංග්‍රිසි) -01
(I පංතිය)
භාෂා පරිවර්තක (ඉංග්‍රිසි/සිංහල) -01
(I පංතිය)

පරිපාලන නිලධාරි -01
ආයතන

(රා.ක.ස.සේ.I ශ්‍රේණිය) - 01
(රා.ක.ස.සේ.II ශ්‍රේණිය) - 01
(රා.ක.ස.සේ.III ශ්‍රේණිය) - 02
(රා.ක.ස.සේ.) (පුරප්පාඩු) - 01
(තො.ස.තා.ස.) (පුරප්පාඩු) - 01

රියදුරු (පුරප්පාඩු) - 02
කා.සේ.සේ.**II** - 02
කා.සේ.සේ.**III** - 03
කා.සේ.සේ. (පුරප්පාඩු) - 01
සනී/කම්කරු (කොන්ත්‍රාත් පදනම) (පුරප්පාඩු) - 01

පරිපාලන නිලධාරි -01
පැමිණිලි (පුරප්පාඩු)

(රා.ක.ස.සේ.I ශ්‍රේණිය) - 01
(රා.ක.ස.සේ.III ශ්‍රේණිය) - 06
(රා.ක.ස.සේ.) (පුරප්පාඩු) - 05

වාර්ෂික අයවැය

පුනරාවර්තන වියදම් වශයෙන් රු.24,676,000.00ක මුදලක් ද, ප්‍රාග්ධන වියදම් වශයෙන් රු.1,474,000.00ක මුදලක් ද වශයෙන් රු.26,150,000.00ක මුළු මුදලක් 2017 වර්ෂය සඳහා වෙන් කරන ලද අතර, මෙම වසර සඳහා තත්‍ය වියදම රු.24,351,000.00ක් වූ අතර, ඉතිරි වූ ප්‍රතිපාදන රු.1,799,000.00කි.

ශීර්ෂ 22 - පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස් කාර්යාලය

01 - මෙහෙයුම් ක්‍රියාකාරකම්

01 - සාමාන්‍ය පරිපාලනය හා ආයතනික සේවා

රු.000

විෂය	විස්තරය	2017 ශුද්ධ ප්‍රතිපාදන	2017 තත්‍ය වියදම්
	පුනරාවර්තන වියදම්	**24676**	**22922**
	පුද්ගලික පඩිනඩි	**9478**	**9444**
1001	වැටුප් හා වේතන	6040	6011
1002	අතිකාල හා නිවාඩු දීමනා	66	66
1003	වෙනත් දීමනා	3372	3367
	ගමන් වියදම්	**711**	**681**
1101	දේශීය	22	21
1102	විදේශ	689	660
	සැපයීම්	**695**	**689**
1201	ලිපිද්‍රව්‍ය හා කාර්යාලීය අවශ්‍යතා	455	454
1202	ඉන්ධන	230	227
1203	ආහාරපාන හා නිල ඇඳුම්	10	08
	නඩත්තු වියදම්	**1002**	**887**

1301	වාහන	467	467
1302	යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ	100	95
1303	ගොඩනැගිලි හා ඉදිකිරීම්	435	325
	ගිවිසුම්ගත සේවා	**12293**	**10733**
1401	ප්‍රවාහන	120	119
1402	තැපැල් හා සන්නිවේදන	550	545
1403	විදුලිය හා ජලය	597	597
1404	කුලී හා දේශීය බදු	10706	9197
1409	වෙනත්	320	275
	මාරු කිරීම්	**434**	**425**
1505	සම්මාදම් හා දායක මුදල්	338	335
1506	දේපල ණය පොලී	96	90
	අනිකුත් පුනරාවර්තන වියදම්	**63**	**63**
1701	පාඩු සහ කපාහැරීම්	63	63
	ප්‍රාග්ධන වියදම්	**1474**	**1429**
	ප්‍රාග්ධන වත්කම් අත්කර ගැනීම	**1424**	**1424**
2102	ගෘහ භාණ්ඩ හා කාර්යාල උපකරණ	1424	1424
	හැකියා වර්ධනය	**50**	**05**
2401	පුහුණු හා හැකියා වර්ධනය	50	05
	මුළු වියදම	**26150**	**24351**
	මුළු මූල්‍යකරණය	**26150**	**24351**
	මූල්‍ය		
	දේශීය	26150	24351

(එල්.ඒ.තිස්ස ඒකනායක)

පරිපාලන කටයුතු පිළිබද පාර්ලිමේන්තු කොමසාරිස්

(ඔම්බුඩ්ස්මන්)